කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)

THE WORLD BANK

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) යනු ශ්‍රී ලංකා රජයේ (GOSL) සහ ලෝක බැංකුවේ (WB) ඒකාබද්ධ අරමුදල් යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 103 ක් වන අතර, ගොවිපළේ සිට පාරිභෝගිකයා දක්වා වූ අගය දමය ඔස්සේ හඳුනාගෙන ඇති අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර සහ වැවිලි යන උප අංශයන්හි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවි ව්‍යාපාර සඳහා සහාය විමට මෙය සැලසුම් කර ඇත. වසර 05 ක කාලයක් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යාපෘති ප්‍රදේශවල කෘෂි-ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායීතාවය, තරඟකාරීත්වය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමයි.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) සහ ක්‍රියාත්මක කිරීමේ ආයතනවල පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වැටුප් ගෙවීම් 2026 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2026 මත පදනම් වේ.

No	Level of Salary Category 02/2026	Designation	Work Place (To be attached under PMU)	NO of Posts
1	C	Senior Social Development Specialist	PMU	1
2	C	ICT/IEC Specialist	PMU	1
3	F	Project Officer (Water Management)	PMU	1
4	F	Technical Officer for 12 Districts	DAD	1
5	F	Project Officer (Procurement)	DAD	1
6	F	Engineer Assistants	ID	4
7	F	Technical Officer for 3 Provinces	PID	1

මූලික සුදුසුකම් සහ පළපුරුද්ද

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 02/2026 හි සඳහන් අවශ්‍යතාවලට අනුකූලව මූලික සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා තිබිය යුතුය.

පොදු කොන්දේසි:

- වයස් සීමාව – අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු හැටතුනට (63) අඩු විය යුතුය.
- ශ්‍රී ලංකාවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘතියක සමාන හෝ ඊට ඉහළ තනතුරක සේවා පළපුරුද්ද තිබීම වඩාත් යෝග්‍ය වේ.
- අවශ්‍යතාවය අනුව ව්‍යාපෘති වැඩබිම් වෙත ගමන් කිරීමට සේවකයින්ට සිදුවනු ඇත.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, පරිගණක සාක්ෂරතාවය සහ රජයේ නීතිරීති හා රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
- අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක තීරණය වේ.
- කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම:

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත ආවරණ ලිපියක් , ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් (Curriculum Vitae) සහ සියලුම සහතිකවල සහතික කළ පිටපත් සමඟ 2026 දෙසැම්බර් 07 වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත සහ ජීව දත්ත පත්‍රිකාව (CV) pmuirdcrp@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට ද යොමු කළ යුතුය.

තොරතුරු ලබාගැනීමේ අරමුණු සඳහා පමණක් https://forms.gle/3yTL9QZU12cPKgSc6 යන සබැඳිය (link) භාවිතා කර ගූගල් පත්‍රිකාව (Google sheet) පුරවන්න. ගූගල් පත්‍රිකාව හරහා ඉදිරිපත් කිරීම නිල අයදුම්පතක් ලෙස සලකනු නොලැබේ.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (**IRDCRP**),

අංක: 123/2, පත්තිපිටිය පාර, බත්තරමුල්ල.

වැඩිදුර තොරතුරු සඳහා (රැකියා විස්තරය / යොමු අනුදේශ , මූලික සුදුසුකම් ආදිය), කරුණාකර වෙබ් අඩවියට පිවිසෙන්න: **https://www.agrimin.gov.lk** සහ **www.irdcrp.lk**

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.